# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1961/26 - 2016 අප්‍රේල් මස 06 වැනි බදාදා - 2016.04.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන *ඉඩම/පරවශතාව ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන *ඉඩමේ /පරවශතාවේ විස්තරය* :

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, අක්මීමන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 109 බී ඉහළගොඩ දකුණ ග්‍රාම නිලධාරි වසමේ ඉහළගොඩ ගමේ පිහිටි මැනුම්පති විසින් පිළියෙල කරන ලද අ.ග.පි. 658 අතිරේක 52 හා 2010.09.13 දිනැති පිඹුරේ කැබලි අංක 1269 වශයෙන් පෙන්නුම් කෙරෙන මුලු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 7.5496ක් වූ පහත විස්තර කරන ඉඩම් කැබැල්ල:

1. **කැබලි අංක 1269**

ඉඩමේ නම: ලෙව්වමීවත්ත; විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිලි 145ක් සහ බුදුමැදුරක් ඇත;හිමිකම් කියන්නා: රජය;මුල් හිමිකම් කියන අය: සභාපති, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව; ප්‍රමාණය: හෙක්. 7.5496

ඉහත සඳහන් *ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2016 ජූනි මස 08 වැනි දින පූ. හා. 10.00 ට අක්මීමන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2016 ජූනි මස 01 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන්, එකී *ඉඩම/පරවශතාවට ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

පුෂ්පිකා තුෂාරි ජාගොඩ,
ප්‍රාදේශීය ලේකම්,
අක්මීමන.

2016 අප්‍රේල් මස 01 වැනි දින,
අක්මීමන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

04 - 830